ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සහ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව රාජ්‍ය ගිණුම් කාරක සභාව සභාගත කළ වාර්තාවට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා අංක : 290

ආයතනයේ නම : ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

කාරක සභාව මගින් හඳුනාගත් අඩුපාඩු		අඩුපාඩු මග හරවා ගැනීමට ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
01	2004.05.11 දිනැති අංක 2004/171 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු, දෙවන හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	පාර්ලිමේන්තුව විසින් වැටුප් සැකසීම සඳහා විශේෂිත පරිගණක මෘදුකාංගයක් භාවිතා කරනු ලබන අතර මුරපද සෑම මාස 03කට වරක්ම යාවත්කාලීන වීම පද්ධතිය මගින්ම සිදුවන අනිවාර්ය අවශ්‍යතාවයකි. එසේ නොවන අවස්ථාවල පද්ධති ප්‍රවේශය අවහිරවීම සිදුවෙයි. එමගින් පද්ධතියට ප්‍රවේශවීම පිළිබඳ ආරක්ෂාව තහවුරු කොට ඇත.
02	විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2වරක් හෝ පවත්වා නොතිබුණි.	2021 වර්ෂයේ කාර්යාල කටයුතු වලට රටෙහි පැවති අයහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් බාධා පැවතීම හේතුවෙන් එක් කළමනාකරණ හා විගණන කමිටුවකට සීමා වීමත් ඉන් අනතුරුව මෙම අවශ්‍යතාවයට අනුගතවීමත් සිදු කොට ඇත.
03	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සිදුකරනු ලැබුවත් පාර්ලිමේන්තු රැස්වීම් හා කමිටු ක්‍රියාවලිය පවත්වාගෙන යාම පිණිස කාර්ය මණ්ඩලය ප්‍රමුඛත්වය ලබාදෙන බැවින් නියමිත කාල රාමුව තුළ වාර්තා ඉදිරිපත් කිරීමට යම් ප්‍රමාදයක් සිදුව ඇති නමුත් 2023 වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා මෙවන විට කමිටු පත් කර ඇති අතර නියමිත කාල පරාසය තුල එය නිම කොට වාර්තා ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.
04	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉහත පිළිතුර (3) හා බැඳේ. 2023 වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල නිර්දේශ නියමිත කාල රාමුව තුළ ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දී ඇත.
05	සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ආරක්ෂක කවුන්සිලය ලබා දුන් උපදෙස් මත "සෙංකෝලය" ලාංඡනය පාර්ලිමේන්තු වාහන වලින් තාවකාලිකව ඉවත් කොට ඇති නමුත් ඉදිරියේදී ලැබෙන උපදෙස් මත නැවත පින්තාරු කිරීමට උපදෙස් ලබා දීමට කටයුතු කරනු ලැබේ.
06	2016.12.29 දිනැති අංක 2016(30) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනයවීම් පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	2023 වසරේදී පාර්ලිමේන්තු සංචිත වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාව සිදුකර ඇත.
07	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර නොතිබුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ සියල්ල මේ වන විට නිරවුල් කර ඇත.
08	2017.09.20 දිනැති අංක 2017(4) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව	පාර්ලිමේන්තු සේවය විශේෂ පනතක ප්‍රතිපාදන මත ආවරණය වන බැවින් අතීතයේ සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ වලට සෘජුව අනුකූලත්වය දක්වා නැති නමුත් මහා

	ආයතනයේ කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	භාණ්ඩාගාරය කලින් කලට විමසනු ලබන තොරතුරු සියල්ල ලබාදෙන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
09	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2021 වසරට අනුකූලව නිලධාරීන් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දීමේ යම් ඌනතාවයක් පෙන්නුම් කළත් මේ වන විට අදාළ සියළුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කොට ඇත.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්